# පොදු පෙරමුණේ අරගලය

පොදුජන එක්සත් පෙරමුණ විසින් සංවිධානය කරන ලද උද්ඝෝෂණ රැලියක් පසුගිය 23 වැනි බදාදා නුගේගොඩ දී පැවැත්විණි. මේ ලිපිය ලියන මොහොත වන විට එහි කරන ලද කතා පිළිබඳ වාර්තා වී නොමැත. එබැවින් ඒ රැලියෙහි දී විවිධ කථිකයන් කුමක් කීවේ දැයි මම නොදනිමි. මේ උද්ඝෝෂණ රැලිය 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට යන්නේ කෙසේ දැයි ජනතාවට පැහැදිලි කර දීම සඳහා වූ බව ඒ නිමිත්තෙන් කොළඹ නගරයේ අලවා තිබූ පෝස්ටරයෙන් කියැවෙයි. ඒ පෝස්ටරය අනුව උද්ඝෝෂණ රැලිය ජනතාකරණයට කම්කරු අයිතිවාසිකම් කප්පාදුවට හා ජීවන වියදම ඉහළ යෑමට එරෙහිව විය. මේ කරුණුවලට එරෙහිව උද්ඝෝෂණ කිරීම අරගල කිරීම හොඳය. එහෙත් අද රටේ ප්‍රධාන ප්‍රශ්නයට පෝස්ටරයෙහි ඉඩක් නොවීය. දෙමළ ජාතිවාදයට රට පාවා දීම සම්බන්ධයෙන් පොදු ජන එක්සත් පෙරමුණේ ස්ථාවරය කුමක්ද? ඊනියා සාම සාකච්ඡා සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් පොදු පෙරමුණට නැත.

ඒ දෑ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට යන්නෙන් කියැවෙන්නේ යැයි කිසිවකු තර්ක කිරීමට ඉඩ ඇත. එමෙන්ම රැස්වීමේ දී කරන ලද ඇතැම් කතාවලින් ඒ පැහැදිලි වී යැයි ද කීමට ඉඩ ඇත. එහෙත් ඒ සියල්ල උගුරට හොරා බෙහෙත් කෑමකි. පොදු ජන එක්සත් පෙරමුණ ප්‍රධාන ප්‍රශ්නයට මුහුණ නොදී ලිස්සා යෑමට කරන වෑයම ඉතා පැහැදිලිය. පසුගියදා පුවත්පත්වල මහින්ද රාජපක්ෂ මහතා නෝර්වේ නියෝජිතයන් මුණ ගැසීම වාර්තා කර තිබුණි. ඒ මහතා සිනහ මුහුණින් නෝර්වේ නියෝජිතයන් සමග කතා කරනු පුවත්පත්වලින් ද රූපවාහිනී නාලිකා මගින් ද අපි දුටුවෙමු. නෝර්වේ නියෝජිතයන් සමග සිනහ මුහුණින් කතා කිරීම වරදක් නොවේ. එහෙත් අපට ප්‍රශ්නය වනුයේ ඒ කතා කෙළේ කුමක්ද යන්නය. එක් රූපවාහිනී නාලිකාවක් නැරඹූ අයකු මට කියා සිටියේ මහින්ද රාජපක්ෂ මහතා නෝර්වේ නියෝජිතයන් සමග නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයාගේ ප්‍රශ්නය කතා කළ බව ඒ නාලිකාවෙන් පැවසුණු බවය. නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයාගේ ප්‍රශ්නය ද විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස කතා කිරීම ද වරදක් නොවේ. රාජපක්ෂ මහතා නැගෙනහිර පළාතේ සිංහලයන්ගේ ප්‍රශ්නය ගැන කතා කෙළේද?

මුස්ලිම් ජනයා ගැන කතා කිරීමට ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය මෙන්ම ජාතික සමගි සංධානය ද වෙයි. සිංහලයන්ගේ ප්‍රශ්න ගැන කතා කරන්නේ කවුද? අද නැගෙනහිර පළාත දෙමළ මෙන්ම මුස්ලිම් ජනයාගේ නිජ භූමිය යැයි ප්‍රභාකරන් බොරුවට හෝ පවසයි. මේ නිසා තත්ත්වය තවත් බරපතළ වී ඇත. ඉන් ගම්‍ය වන්නේ නැගෙනහිර පළාත සිංහලයන්ගේ නිජ භූමිය නොවන බවය. මා කිහිප වතාවක්ම කලින් සඳහන් කර ඇති පරිදි මේ හේතුවෙන් නැගෙනහිර පළාතේ සිංහලයෝ ඒ පළාතේ පිටස්තරයෝ වෙති. නැගෙනහිර පළාතේ ඉඩම්වලින් සියයට පණහකට වැඩි ප්‍රමාණයක් තවමත් සිංහලයන් සතු බව සිංහල ජාතික සංගමය පෙන්වා දී ඇත. සෙනරත් රජු දවස එය සියයට සියයක්ම විය. එකල රජු අද නැගෙනහිර පළාත යැයි නම් කෙරී ඇති ප්‍රදේශයේ ද ඉඩම්වල භාරකරු විය. සිංහල බෞද්ධ සම්ප්‍රදායට අනුව රජු ඉඩම්වල අයිතිකරු නොව භාරකරු විය. ඉංගිරිසි (රෝම ලන්දේසි) නීතියට අනුරූපව කතා කරන විට ඉඩම් රජුට අයිති වී යැයි කිව හැකිය. සෙනරත් රජු මුස්ලිමුන් අද නැගෙනහිර පළාත යැයි නම් කෙරෙන ප්‍රදේශයේ පදිංචි නොකරන්නට මුස්ලිමුන්ට අද වන විට එහි ඉඩම් අයිති කර ගැනීමට අවස්ථාවක් උදා නොවීමට තිබුණි. දෙමළ ජනයා නැගෙනහිර පළාතේ ස්ථිරව පදිංචි කරනු ලැබුයේ ලන්දේසින් හා වැඩි වශයෙන් ඉංගිරිසින් විසිනි. අද වන විට මුස්ලිම් ජනයා හා දෙමළ ජනයා නැගෙනහිර පළාතේ ඉඩම් අයිති කරගෙන තිබීම නිසා සෙනරත් රජුගේ කාලයේ සිට අද වන විට සිංහලයන්ගේ ඉඩම් අයිතිය 100% සිට 50% ක් පමණ දක්වා පහත වැටී ඇත.

මේ අතර අවුරුදු දහස් ගණනක් අද නැගෙනහිර පළාත යැයි හැඳින්වෙන ප්‍රදේශයේ පදිංචිව සිටි සිංහලයන්ට එහි නිජ භූමියක් නැත. එහෙත් ඒ පළාත සෙනරත් රජු දවස එහි පැමිණි මුස්ලිම් ජනයාගේ ද ඊටත් පසුව එහි පැමිණි දෙමළ ජනයාගේ ද නිජ භූමිය වෙයි‍ෟ මේ තත්ත්වයට වගකිව යුත්තෝ එ. ජා. පක්ෂයේ හා පොදු පෙරමුණේ නායකයන් යැයි කියා ගන්නෝය. ඉංගිරිසින් විසින් අපේ නායකයන් බවට පත් කරනු ලැබූ මොවුහු අද නෝර්වේ ඇතුළු ඇමරිකන් ප්‍රධාන බටහිරයන් ඉදිරියේ වැඳ වැටෙති. යම් අයුරකින් උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රභාකරන්ගේ කොටි සංවිධානය බලයට පත්වුවහොත් පළමුව සිංහලයන් ද පසුව මුස්ලිම් ජනයා ද නැගෙනහිර

පළාතෙන් එළවා දැමෙනු ඇත. ප්‍රභාකරන් එහි පළමු පියවර ලෙස නැගෙනහිර පළාතෙන් හමුදාව එළවා දැමීමටත් එහි සිංහල හා මුස්ලිම් ජනයා බිය වැද්දීමටත් කටයුතු කරමින් සිටියි. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය පුස්සක් වන බව දැනගත් දා සිට, ඊනියා සිවිල් වැසියන් ලවා හමුදා කඳවුරුවලට පහර දීමටත් හර්තාල් උද්ඝෝෂණ ආදිය කිරීමටත් කොටි ක්‍රියා කර ඇත්තේ එහි ප්‍රතිඵලයක් ලෙසය.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට ඔබ්බෙන් ඇත්තේ කුමක්දැයි පොදු පෙරමුණට හාංකවිසියක හෝ දැනුමක් නැත. දෙමළ ජාතිවාදී ප්‍රශ්නයට බටහිරයන් කියන ආකාරයට තේරුම් ගන්නා අයට ඇති දැනුම කුමක් ද? චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය තවමත් දෙමළ ජනයාට වූ අසාධාරණකම් ගැන නන් දොඩවයි. මේ රටේ ඇත්තේ බටහිර අනුග්‍රහත්වයෙන් දෙමළ ජාතිවාදීන් සිංහලත්වයට හිමි තැන අහිමි කිරීම පිළිබඳ ප්‍රශ්නයක් මිස අනෙකක් නොවන බව කරුණු සහිතව පැහැදිලි කර දී ඇත්තෙමි. ඒ අපේ ප්‍රධාන ප්‍රවාදයයි. අප කරුණු ඉදිරිපත් කරන්නේ සමස්තයක් තුළ සංගත ආකාරයකටය. ප්‍රවාදයක් නැතිව කටයුතු කරන්නෝ ඇතැම් විට අතනින් මෙතනින් අසංගතව කරුණු ඉදිරිපත් කර සතුරන්ට ආයුධ සපයති.

19 වැනි සියවසේ අග පවා දෙමළ නමින් හඳුන්වනු ලැබුයේ වෙල්ලාලන් පමණක් බව ජී. බී. ඩී. ද සිල්වා මහතා සඳහන් කරයි. මේ වෙල්ලාලයෝ බ්‍රිතානි යටත්විජිතවාදය තුළ වුව ද යාපන අර්ධද්වීපයෙහි කෲර ආධිපත්‍යයක් පැතිරවූහ. ඔවුන්ට අවශ්‍ය වුයේ යටත්විජිතවාදය තුළ මුළු රටේම තම ආධිපත්‍ය පැතිරවීමය. එයට බ්‍රිතානීන්ගේ ද සහාය ලැබිණි. පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්, ආනන්ද කුමාරස්වාමි ඇතුළු පොන්නම්බලම් කුමාරස්වාමි පවුල දේශපාලන හා සංස්කෘතික ක්ෂෙත්‍රවල ආධිපත්‍ය දැරූහ, කොළඹ මධ්‍යය කරගත් ආර්ථිකයෙහි ද ආධිපත්‍ය අසිංහලයෝ එනම් දෙමළ, මුස්ලිම්, හෙට්ටි, බෝර ආදීහු දැරූහ. සිංහලයෝ ක්‍රමයෙන් තම අයිතීන් ඉල්ලා සිටියහ. විශේෂයෙන්ම සිංහල බෞද්ධයෝ ධර්මපාල තුමාගේ නායකත්වය යටතේ ඉදිරියට ඒමට පටන් ගත්හ. දෙමළ ජනයා අතර වෙල්ලාලයන් හැර අනෙක් කොටස් දෙමළ වුයේ විසිවැනි සියවස මුල වුවද සිංහලයන්ට එවැනි ප්‍රශ්නයක් නොවීය. සිංහලයෝ පණ්ඩුකාභය රජු දවස සිංහලයන් බවටද දුටුගැමුණු රජු දවස සිංහල, බෞද්ධයන් බවටද පත්ව සිටියහ. සිංහලයන්ගේ කුල ක්‍රමය ශ්‍රේණි ක්‍රමයක් විය. සියලු කුලවල ජනයා සිංහලයෝ වූහ. සියළු කුලවල ජනයාගේ වීරයා වුයේ දුටුගැමුණු රජය. විසිවැනි සියවසේ දී ඔවුන්ට අමුතුවෙන් සිංහල වීමට දෙයක් නොතිබුණි. ධර්මපාලතුමා කෙළේ එතුමා දැන සිටි ආකාරයට සිංහලයන්ගේ ඉතිහාසය ප්‍රකාශ කිරීම මිස ඇතැමුන් කියන ආකාරයට ආර්ය සිංහල මිථ්‍යාවක් වපුරවමින් සිංහල ජාතියක් අලුතින් ගොඩ නැංවීම නොවේ.

ධර්මපාලතුමාගේ ව්‍යාපාරයෙහි තර්ජනය දුටු බ්‍රිතානීහු තමන් සිංහලයනට සැපයූ නායකයන්ගේද උපකාරයෙන් ධර්මපාල තුමා පරාජය කළහ. සිංහල බහුතරය ව්‍යවස්ථාදායකයේ සුළුතරය බවට පත්කිරීමට දෙමළ ජාතිවාදය අවශ්‍ය විය. කෙසේ වෙතත් කිසිම මගකින් බහුතරයක් සුළුතරයක් කිරීමට නොහැකිය. තමන් ඇතිකළ නායකයන් ගැන පූර්ණ විශ්වාසය තිබු සුද්දෝ (ධර්මපාල තුමා මේ කළු සුද්දන් නායකයන් වීම ගැන අගේට කියා ඇත.) 1931 දී සුදු නොවන වෙනත් රටකට පළමු ලංකාවට සර්වජන ඡන්දය දුන්හ. සුද්දන්ගේ හා වෙල්ලාලයන්ගේ පැත්තෙන් බැලූ කල මෙය අනුවණ ක්‍රියාවක් විය. සර්වජන ඡන්දය සමග රටේ සිංහලයන් බහුරතය බැවින් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිංහල මන්ත්‍රී සංඛ්‍යාව වැඩි විය. 1947 වන විට දෙමළ නායකයෝ, විශේෂයෙන් ම ක්‍රිස්තියානීහු, කොළඹ මධ්‍යයේ ආධිපත්‍ය පිළිබඳ අදහස අත්හැර උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම රාජ්‍යයක් ගොඩ නැගීමට කටයුතු කළහ. ඒ පළාත් සඳහා බොරු ඉතිහාසයක් නිර්මාණය කළහ. ඊනියා නිජභූමි සංකල්පයද 1976 න් පසුව ඉදිරිපත් කෙරිණි. හැත්තෑ ගණන්වල සිට දෙමළ ජාතිවාදීහු ආයුධ ගත්හ. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජාතිවාදයට දීම සඳහා වර්තමානයේ බටහිර අවශ්‍යතා අනුව ක්‍රියා කරන ඒ. ජා. පක්ෂය ඒ සඳහා ගෙන ඒමට අදහස් කළ පනත්වලින් මුල් පනත විය. පළමුවෙන්ම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිනිය සතු බලතල කප්පාදු කර තුනෙන් දෙකේ බහුතරයක් ලබා ගැනීම එ. ජා. පක්ෂයේ අදහස විය. එහෙත් අද එය ව්‍යර්ථ වී ඇත. දැන් අගමැති ප්‍රධාන ආණ්ඩුව කුමක් කරයි ද? ඔවුන් කරන්නේ බටහිරයන්ට අවශ්‍ය දේය.

අද බටහිර යටත්විජිතවාදයේ ප්‍රධාන සංරචකය බවට පත් වී ඇත්තේ සංස්කෘතික සංරචකයයි. දේශපාලන හා ආර්ථික සංරචක අද දෙවැනි තැනක් ගනියි. එයට හේතුව බටහිර යටත්විජිතවාදය ඒ ක්ෂෙත්‍ර දෙකෙහි බොහෝ දුරට ජයග්‍රහණය කර තිබීමය. ඊනියා ජනතාකරණයට හා විවෘත ආර්ථිකයට අද එතරම් තර්ජනයක් එල්ල නොවේ පොදු

© Prof. Nalin De Silva

පෙරමුණ ඒවාට විරුද්ධව කරන උද්ඝෝෂණ එතරම් ඵලදායී නොවන බව බටහිරයෝ දනිති. බටහිරයෝ ඒ ගැන තැකීමක් නොකරති. බටහිරයන්ට ප්‍රශ්නයක් වන්නේ සිංහලත්වයට හිමි තැන අහිමි කිරීමට එරෙහිව පොදු පෙරමුණ අරගල කරන්නේ නම්ය. ඒ කරුණ සංස්කෘතික යටත්විජිතවාදය සමග බැඳී ඇත. බටහිරයෝ පොදු පෙරමුණ ඒ අරගලයෙන් පිටත තැබීමට කටයුතු කරති. ප්‍රධාන ප්‍රශ්නය වෙනුවට ද්විතීයික ප්‍රශ්නවලට වැදගත් කමක් දීමට පොදු පෙරමුණ කටයුතු කරන්නේ මේ බටහිර බලපෑම යටතේය.

පොදු පෙරමුණ ප්‍රධාන ප්‍රශ්නය වෙනුවෙන් අරගල නොකරන්නේ නම් සිංහලයන් වැඩි කල් නොගොස් වෙනත් අතක් බලනු ඇත. දෙමළ ජාතිවාදය පිළිබඳ ප්‍රශ්නය විසඳෙන්නේ නැගෙනහිර පළාතේ බව අපි කිහිප වතාවක් කියා ඇත්තෙමු. මුස්ලිම් ජනයා ද උතුරු හා නැගෙනහිර පළාත් එක් කිරීමට විරුද්ධ වෙති. හදිසි නීතිය යටතේ එක්කරන ලද උතුරු හා නැගෙනහිර පළාත් එක් කිරීමට විරුද්ධ වෙති. හදිසි නීතිය යටතේ එක්කරන ලද උතුරු හා නැගෙනහිර පළාත් හදිසි නීතිය ඉවත් කිරීමත් සමග වෙන් වී ඇත. කලින් ලිපිවල ද කියා ඇති ආකාරයට අද කළ යුත්තේ සිංහල මන්ත්‍රී සංධානය ද යෝජනා කර ඇති පරිදි නැගෙනහිර පළාත සඳහා වෙනම ආණ්ඩුකාරයකු පත් කිරීමය. එයට මුස්ලිම් ජනයාද කැමැත්ත පළ කර ඇත. පොදු පෙරමුණේ කෂණික අරගලය ඒ සඳහා විය යුතුය. බටහිරයන් අගමැතිවරයාට උපදෙස් දෙනු ඇත්තේ කෙසේ හෝ පාර්ලිමේන්තුව විසුරුවා නොහැර දිගටම කටයුතු කිරීමට යැයි සිතිය හැකිය. ඒ සඳහා ජනාධිපතිනියට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැකි කාලය අවුරුදු එකේ සිට තුන දක්වා වැඩි කිරීමේ සිට නැවතත් පොදු පෙරමුණේ මන්ත්‍රීවරුන් මිලදී ගැනීම දක්වා ව්‍යාපෘති ඇති කෙරෙනු ඇත. ඊනියා හෘදය සාකෂි වගන්තිය ඇතුළත් පණතක් වෙනත් ආකාරයට හෝ ගෙන ඒමට උත්සාහ දරනු ඇත. ඒ සියල්ල තිබිය දී පොදු පෙරමුණ නැගෙනහිර පළාතට වෙනම ආණ්ඩුකාරයකු පත් කර ගැනීමට කටයුතු කළයුතුය. ඉන් පසුව සමස්ත දෙමළ ජාතිවාදී ප්‍රශ්නය නැවතත් මධ්‍යයට ගෙන ආ යුතුය. උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙනම පාලනයක් දීමෙන් ප්‍රශ්නය තවත් උග්‍ර වී දේශසීමා අරගලයක් දක්වා ප්‍රශ්නය වර්ධනය වනු ඇත. ඒ පළාත්වලට වෙනම පාලනයක් දීම ඉතිහාසයට හා වර්තමානයට පටහැණි බවද එය කළ නොහැකි බව අද එ. ජා. පකෂයේ කෙසේ වෙතත් පොදු පෙරමුණ අවබෝධ කර ගත යුතුය. තමන්ට අවශ්‍ය අන්දමට මධ්‍යය හැසිරවීමට නොහැකිව මධ්‍යයෙන් ප්‍රාන්තයට ගිය දෙමළ ජාතිවාදීන් නැවතත් මධ්‍යයට ගෙන ආ යුතුය. නැගෙනහිර පළාතට වෙනමම ආණ්ඩුකාරයකු පත් කරන්නේ නම් මුස්ලිම් ජනයා ද වෙනම කලාප ඉල්ලීම ඉවත දමා නැවතත් මධ්‍යට පැමිණෙනු ඇත. සිංහලත්වයට හිමි තැන අහිමි නොකර මධ්‍යයේ බලය බෙදා හදා ගැනීම (බෙදීම නොව) ගැන අප කතා කෙළේ අවුරුදු ගණනකට පෙරය. දැන්වත් පොදු පෙරමුණේ අරගලය ඒ දෙසට යොමු කළ යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva